# ගම්බද අසිරිය



වයි.එම්.එච්. දෙව්මිණී රාජකරුණා.

# ගම්බද අසිරිය

වයි.එම්.එච්. දෙව්මිණි රාජකරුණා

කතෘ

කතෘගේ වෙනත් කෘති:

- අපේ පුංචි කොන්ඩ කුරුල්ලා 2020 වර්ෂය
- අහිංසක මුව පැටියා 2021 වර්ෂය
- මම හොඳ දරුවෙක් වෙමි 2022 වර්ෂය
- අහිංසක බිම්මල 2023 වර්ෂය

පාසල - මහමායා බාලිකා විදුහල
පංතිය - 6-D
කෘතිය පළ කරන දිනය - 2025.02.08

ISBN NO = 978-624-208-169-4

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන“හෙරණ ගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පිදුම

"අකුරු මඟින් සැරසුණු අලුත් ලෝකයකට!"

දයාබර පාඨකයා,
මෙම පොත,
ඔබේ සිත පුබුදු කරමින්,
අකුරු මත පියඹන්නට සූදානම් කරයි.

ඇදහිය නොහැකි කතා,
රසවත් සිතුවිලි,
ගවේෂණය සහ අලුත් අත්දැකීම්
ඔබට මෙහි ලැබේවා!

ඔබේ කුටිය අරගෙන,
අකුරු ලෝකයේ නව ගමනක් ආරම්භ කරන්න.
ඇරඹුමක් මෙන්න – "අකුරු
මඟින් සැරසුණු ලෝකය"!

# ගම්බද අසිරිය

මගේ ගම මහනුවරය. නමුත් මගේ තාත්තගේ උපන් ගම කුරුණෑගල පොල්පිතිගමය. සති අන්තයේ අපගේ බලවත් ඇවිටිල්ල නිසාම තාත්තගේ උපන් ගම බලා අපව කැටුව යාමට දෙමව්පියන්ට සිදුවිය.




ඒ අනුව උදෑසන මහනුවරින් අපගේ ගමන ආරම්භ විය. අම්මා, තාත්තා, ලොකු අම්මා, අයියා, අක්කා සහ මම අපගේ එම නඩයට අයත් විමු.



අපි දින කිහිපයක් සදහා ප්‍රමාණවත් ඇඳුම්ද බෑග්වල අසුරාගෙන පැමිණියෙමු. රෑ බෝ වීමට ප්‍රථම කුරුණෑගලට ළගා වීමට අපට හැකි විය. රාත්‍රී ආහාරය ගත් අපි ගමන් මහන්සිය නිසා ඉක්මනින් නින්දට වැටුණෙමු.



නොදැනුවත්ම තවත් එක් සුන්දර දවසකට හිරු පායාවිත් අපට අත වනන්නට විය. අද දවසේ අපගේ මුල්ම කාර්යය වූයේ ගමේ කෙළවරක ඇති වැව දැක ගැනීමයි. ඒ සඳහා අපට මග පෙන්වීමට තවත් පවුලේ හිතවතෙකු එක් විය. ඒ අනුව මම, අයියා, අක්කා, රන්දු අයියාද සමඟ වැව බැලීමට පිටත් වුණෙමු.



දවසේ අසිරිමත් බව වැඩි කරමින් වැව පුරා නෙළුම්, මානෙල් , ඕලු මල් පිපී තිබෙනු දැක අපි වඩ වඩාත් සතුටට පත් වුණෙමු. වැව අසල විශාල රුස්ස ගසක් තිබූ අතර එම ගස අසලින් සෑදී ඇති කුඩා අඩි පාරක් දැක අප එම අඩි පාර දිගේ ඉදිරියට ගමන් කළෙමු. එසේ යන විට ඉදිරියෙන් තවත් දියකඩිත්තක් හමු විය.



ඒ අසල සාරෙට වැවුණු වෙල් යායක් ද දක්නට ලැබුණි. අප සියලු දෙනා එම දිය පහරට බැස සිත් සේ නා ගත්තෙමු. දිය බුං ගසමින් වතුර ඉස ගනිමින් සෙල්ලම් කරමින් ඒ අසල තිබූ අලංකාර ලොකු කුඩා ගල් රාශියක් ද එකතු කර ගත්තෙමු. එම ගල් සියල්ල එකතු කොට ඇළ මාර්ගය හරස් කොට වේල්ලක් බැඳීමට අප ගත් උත්සාහය සාර්ථක විය.



ටික වේලාවකින් විනෝදයෙන් කෑ කෝ ගසමින් සිටි අපට එක්වරම "මොකද ඔය කරන්නේ" යනුවෙන් කෑ ගසන ශබ්දයක් ඇසුණි. එම ඇළ පහරින් ජලය ලබාගෙන ගොවිතැන් කරන ගෙවිලියක් පැමිණ "ඔතැන ඔහොම හරස් කලාම අපට පහළ කුඹුරට වතුර එන්නේ නෑ" කියා තව මොනවාදෝ කියමින් බැන වදින්නට විය.




දැඩි ලෙස බියට පත් වූ අප ඉතා ඉක්මනින් එම වේල්ල කඩා බිඳ දමා දුවන්නට විය. එසේ නොවූනානම් තවත් අය එතනට ගෙන්වන්නට ඉඩ තිබුණි. ටික වෙලාවකින් නැවතත් ගමන ආරම්භ කළ ගස අසලට පැමිණීමට අපට හැකිවිය.



එම ගසට නුදුරින් කුඩා ගොඩනැගිල්ලක් දක්නට ලැබුණි. එම ගමේ මසකට වරක් පැවත්වෙන කුමක් හෝ රැස්වීමකට ගමේ නැන්දලා මාමලා කසු කුසු ගාමින් රැස්වී සිටිනු දක්නට ලැබුණි. තෙත බැරිත් වූ ඇඳුම් ඇඳගෙන සිටි අප දෙස එහි සිටි සියලු දෙන විමසිල්ලෙන් බලනු දුටු විට අපට මහත් ලැජ්ජාවක් ඇති විය.



එම නිසා අපි පසුපස නොබලා නැවත නිවස දෙසට වේගයෙන් දිව ගියෙමු. හති දමමින් සියලු දෙනා ගේ ඉදිරිපස ඇති බැම්මේ වාඩි වූණෙමු.



අපගේ ශබ්දය අසා නිවසින් එබී බැලූ අම්මා “කොහෙද මෙච්චර වෙලා ගියේ අපි මේ බයවෙලා බලාගෙන හිටියේ ඔයාල එනකල් යැයි කීවාය.



අපට සිදු වූ සියලු අකරතැබ්බයන් අම්මාට පැවසුවෙමු. තාත්තාත් ඒ අසල සිටිමින් අප කියූ විස්තරය අසා  සිටියේ සිනාසෙමිනි. එය අසා සිටි අම්මා අපට එහි හොද නරක කියා දුන්නාය. "හා හා දැන් ඇඳුම් මාරු කරගෙන ඉක්මනින් එන්න කෑම කන්න. නිවිලත් ඇති කීවාය."



ඉන් පසු උදෑසන ආහාරය සඳහා සියලුදෙනාම ඉදගත්තේ ඉතා සතුටිනි. ඒ වෙනදාට වඩා වෙනස්ම ආහාර වේලක් අප සඳහා සූදානම්ව තිබෙණු දැකීමෙනි. මා මෙන්ම අනිත් අයත් ඉතා ආශාවෙන් උදේ ආහාරය ගත් බව මට පෙනුණි.



ආහාර ගැනීමෙන් පසු අප සියලු දෙන නැවතත් ගමේ අසිරිය දැකීම සදහා පිටත් වුණෙමු. නුවර ඉතා සීමිත ඉඩ කඩකට සීමා වූ අපිට මෙහි නිදහසේ කෙළිදෙලෙන් සැරිසරන්නට හැකි විය. අත්තවු ලද කුරුළු පැටවුන් සේ අපි එහෙ මෙහෙ දුව පනිමින් වට පිටාවේ ඇති විශාල ගස් , ගල් , අලංකාර තැනිතලා , වැව් , ඇලදොළ ආදිය දැකීමෙන් සතුටට පත් වුණෙමු.



ගමේ සුන්දරත්වයෙන් වශීවී සිටි අපට කාලය වේගයෙන් ගමන්කරන බවත් නොතේරුනි. දහවල් ආහාරය සඳහා නැවත නිවස බලා යාමට සිදුවීම මගේ සිතටනම් දැඩි ශෝකයක් විය . මා හට අවැසි වුයේ මොහොතක් හෝ මේ සිසිල විදිමයි . දහවල් ආහාරය ඉතා සතුටින් භුක්තිවිදීමට හැකි විය .




ටික වෙලාවක් විවේකිව සිට අපගේ මීළග කාර්යය වුයේ නැමට වැවට පිටත්වීමයි. අප සියලු දෙන වැව දෙසට ගමන් කරන විට කිසිසේත් බලාපොරෝත්තු නොවූ දෙයක් සිදු විය. වැව දෙස සිටි අයියලා කිහිප දෙනෙක් අතුරින් එක් අයෙක් කතා කොට “බාප්පේ නංගිලා මෙහෙට නම් එවන්න එපා” යැයි කිවේය .




කුමක් සිදු වන්නේ දැයි අපට සිතා ගත නොහැකිව විස්මයට පත්ව බලා සිටින අතර තාත්තා පමණක් ඉදිරියට ගමන් කරන්නට විය. "බාප්පේ නංගිලවත් අරන් දුවන්න "යැයි කලින් කෑ ගැසූ අයියලම නැවතත් කෑ ගසන්නට විය .




කිසිවක් සිතා ගත නොහැකිව වට පිට බැලූ අපට දක්නට ලැබුනේ වැව අසල ඇති විශාල ගසක බඹර කූඩුවක් ඇවිස්සි ඇති බවයි . ක්ෂණකයින් එම බඹරුන් අප සිටි පැත්තට එනු ඇත. මොහොතක් ගල් ගැසී සිටි අපිට බයිසිකලයකින් පැමිණි අපේ මාමා කෙනෙක් “දුවන්න නංගි “යැයි අම්මාට කියන තුරු කකුල් පණ නැති වූ ලෙසින් සිටියෙමු .



අයියා , අක්කා , රන්දු අයියා ඉතා වේගයෙන් ඉදිරියට දිව යන්නන්ට වූ අතර වැව කිට්ටුවෙන් සිටි තාත්තා ඇඳ සිටි සරම ඔලුවේ සිට පොරවා ගත්තේය.



අම්මා අතේ අප සියලු දෙන නෑමට ගෙනා රෙදිද විය. ඇය ඒවා එක අතකින් ගෙන අනිත් අතින් ලොකු අම්මාද ඇදගෙන දුවන්නට විය. වැව අසල සිටි අයියලා වේගයෙන් වතුරට පනිනු නොදුටුවත් ඒ ශබ්දයෙන් මම සිතා ගත්තෙමි .



එක් අයෙකුට පමණක් වැවට පැනීමට නොහැකි වූ අතර බඹරු ඔහුව වසා ගන්නා ආකාරය පිටුපස හැරී බැලූ විට මට දක්නට ලැබුනි. ඔහු කෑගසමින් අප පසු පස දිව එන්නට විය.



අම්මා හා ලොකු අම්මා රෙදිත් අතේ ගෙන දුව එන අයුරු දැක මට ඔවුන් දෙදෙනා ගැන විශාල දුකක් ඇති විය . ඒ වනවිට අයියලා වේගයෙන් දුව ගොස් අසල තිබූ නිවසට මුවා වී අවසානය, මට ඉතා වේගයෙන් දුවන්න පුළුවන් වුවත් අම්මලා දමා යන්නට නොහැකි නිසා ඔවුන් සමග හෙමින් දිව එන්නට සිදුවිය . මට ඒ මොහොතේ අයියලාට ගැසීමට තරම් කේන්තියක් ඇති විය .



වැවෙන් නාන්නට හින දකිමින් සිටි අපට නිවසේ ළිඳෙන් නාන්නට සිදුවීම මහත් දුකකි.



ඉන් පසුව එම නිවසේ අය සමග අප සතුටු සාමීච්චියේ යෙදෙමින් අද දවසේ සිදුවූ රසවත් සිදුවීම් නැවතත් සිහි කරමින් සිනාසෙන්නට අපට හැකිවිය . රාත්‍රී ආහාරය ගෙන අප සැම නින්දට ගියෙමු . සිහිනයෙන් මට පෙනුනේ දහවල් සිදුවීමය . පසු දින පහන් වුයේ නැවතත් නුවර බලා පිටත් වීමට ඇති බව මතක් කරමිනි. නිවසේ අයගෙන් සමුගත් අපි නැවතත් පාසල් නිවාඩුවකට මෙහි පැමිණෙන බලාපොරොත්තු කරපින්නා ගෙන අසිරිමත් ගම් පියසට ආයුබෝවන් කීවෙමු.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම්

# නිමි.